TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ශ්‍රී ලංකා – ප්‍රසම්පාදනය 101

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that uholds integrity

## මහජන ප්‍රසම්පාදනය යනු කුමක්ද?

රාජ්‍ය අංශයන්හි ප්‍රධාන ආයෝජනයන් සඳහා තුන්වන පාර්ශවීය විකුණුම්කරුවන් හෝ සැපයුම්කරුවන් යන බාහිර මූලාශ්‍ර මඟින් භාණ්ඩ, සේවා සහ වැඩ ලබා ගැනීමේ සහ මිලදී ගැනීමේ ක්‍රියාවලියයි.

## ශ්‍රී ලංකාවේ මහජන ප්‍රසම්පාදනය සම්බන්ධ ප්‍රධාන මාර්ගෝපදේශ

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශය 2006
- ප්‍රසම්පාදන අත්පොත

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# ප්‍රසම්පාදන වර්ගීකරණයන්

## භාණ්ඩ

ඝන, ද්‍රව හෝ වායුමය මෙන්ම විදුලිය ස්වරූපයෙන් යන සෑම විස්තරයකටම අයත් වෙළඳ භාණ්ඩ, අමුද්‍රව්‍ය, නිෂ්පාදන, උපකරණ සහ වෙනත් භෞතික වස්තූන්.

## සේවා

උපදේශන සේවා හැර වෙනත් සේවා

## වැඩ

ගොඩනැගිලි තැනීම, ප්‍රතිසංස්කරණය කිරීම, කඩාබිඳ දැමීම, අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම, ව්‍යුහගතයන් හෝ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් වන එනම්, වැඩබිම සකස් කිරීම, කැණීම, ඉදිකිරීම, ගොඩනැඟීම, උපකරණ හෝ ද්‍රව්‍ය සවි කිරීම, සැරසීම සහ නිම කිරීම.

# ප්‍රසම්පාදන ආයතනයක් යනු කුමක්ද?

ප්‍රසම්පාදන ආයතනයක් යනු භාණ්ඩ, සේවා හෝ වැඩ මිලදී ගන්නා ආයතන සංවිධානයක් ය.

පහත සඳහන් ආයතන එයට ඇතුළත් වේ:

- රාජ්‍ය අමාත්‍යාංශ
- පළාත් සභා
- රාජ්‍ය දෙපාර්තමේන්තු
- ව්‍යවස්ථාපිත බලධාරීන්
- රාජ්‍ය සංස්ථා
- රජය සතු සමාගම්
- ප්‍රාදේශීය අධිකාරිය හෝ එහි ඕනෑම අනු ඛණ්ඩයක්
- පූර්ණ හෝ අර්ධ වශයෙන් ශී්ර ලංකා රජය සතු වෙනත් ඕනෑම ආයතනයක්
- ශ්‍රී ලංකා රජයට එලදායී පාලනයක් ඇති ආයතන

# ප්‍රසම්පාදන ක්‍රමවේද

***ඔබ ප්‍රසම්පාදන ක්‍රමවේදයක් තෝරා ගන්නේ කෙසේද?***

ව්‍යාපෘතියේ ස්වභාවය, ප්‍රමාණය සහ එහි ප්‍රසම්පාදන මූලිකාංග අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශන වල දක්වා ඇති ඕනෑම ක්‍රමයක් ප්‍රසම්පාදන ආයතනයට භාවිතා කළ හැකිය.

ප්‍රසම්පාදන ක්‍රමවේදය තෝරා ගැනීම රඳා පවතිනුයේ:

- ප්‍රසම්පාදනය කළ යුතු භාණ්ඩ හා සේවා වල ස්වභාවය
- ප්‍රසම්පාදනයේ වටිනාකම
- දේශීය වශයෙන් භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ඇති හැකියාව සහ පිරිවැය
- භාරදීම සඳහා වන තීරණාත්මක දිනයන්
- අරමුදල් සපයන ආයතනය සමඟ එළඹෙන ගිවිසුම
- යෝජිත ක්‍රියා පටිපාටිවල විනිවිදභාවය

# ප්‍රසම්පාදන ක්‍රමවේදයන් මොනවද?

1. ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීම
2. ජාතික තරඟකාරී ලංසු තැබීම
3. සීමිත/ පාලිත ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීම/ සීමිත/ පාලිත ජාතික තරඟකාරී ලංසු තැබීම

1. සාප්පු යාම
2. ඍජු කොන්ත්‍රාත්තු
3. යළි ඇණවුම් කිරීම
4. බලහත්කාර ගිණුම
5. හදිසි ප්‍රසම්පාදනය
6. ප්‍රසම්පාදනය සඳහා ප්‍රජා සහභාගීත්වය
7. ද්විත්ව අදියර ලංසු ක්‍රමය
8. ද්විත්ව කවර ක්‍රමය
9. ලංසුකරුවන්ගේ පූර්ව සුදුසුකම්

# ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ප්‍රසම්පාදන ක්‍රියාවලිය යනු, තම අවශ්‍යතා සපුරා ගැනීමට සහ ඔවුන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට භාණ්ඩ හා සේවා සපයා ගැනීම සඳහා ප්‍රසම්පාදන ආයතනය විසින් යම් යම් පියවරයන් හඳුනා ගැනීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමයි.

ප්‍රසම්පාදන ක්‍රියාවලිය වැදගත් වනුයේ, එම ආයතනයට කොපමණ ප්‍රමාණයක් ඉතිරි කළ හැකිද යන්න කෙරෙහි එය සෘජුවම බලපාන බැවිනි.

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# ප්‍රසම්පාදන ක්‍රියාවලියේ පියවරයන්

- **සැලසුම් කිරීම**

නිසි කාල සීමාවට ව්‍යාපෘතිය නිම කිරීම සහතික කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය කාර්යක්ෂමව සැලසුම් කිරීම.

- **සාමාන්‍ය නිවේදනය**

ප්‍රසම්පාදන දැන්වීම ප්‍රසම්පාදන ආයතන වෙබ් අඩවියේ පළ කළ යුතුය.

- **ලංසු කැඳවීමේ ලේඛන**

අනාගත ලංසුකරුවෙකු සඳහා අවශ්‍ය වන තොරතුරු සහිත ලංසු කැඳවීමේ ලේඛන කෙටුම්පත් කිරීම.

- **ලංසු ඉදිරිපත් කිරීම සහ විවෘත කිරීම**

නියමිත දින තුළ යෝජනා ඉදිරිපත් කිරීමට ලංසුකරුවන්ට ආරාධනා කිරීම.

- **ලංසු ඇගයීම**

වඩාත් ලාභදායී, ගුණාත්මක ලංසුව තීරණය කිරීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම.

- **සම්මානය පිළිබඳ දැනුම්දීම**

කොන්ත්‍රාත්තුව ප්‍රධානය කිරීම පිළිබඳ තේරීමෙන් සතියක් ඇතුළත සියලුම ලංසුකරුවන්ට දැනුම් දිය යුතුය.

- **කොන්ත්‍රාත්තුව අත්සන් කිරීම**

ජයග්‍රාහී ලංසුකරු සහ අදාළ මූල්‍ය අධිකාරිය විධිමත් ගිවිසුමකට එළඹිය යුතුය.

# කමිටු සහ වගකීම්

ප්‍රසම්පාදන ක්‍රියාවල වගකීම පැවරෙනුයේ, එම අමාත්‍යාංශවල ප්‍රධාන ගිණුම්කරණ නිලධාරින් ලෙස සලකනු ලබන, අදාළ රේඛීය අමාත්‍යාංශවල ලේකම්වරුන් වෙතය.

<u>ප්‍රසම්පාදන කමිටු</u>

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු
- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු
- ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු
- ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු

ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයින් සාමූහිකව හා තනි තනිව වගකිව යුතු වන්නේ :

(අ) සලකා බලනු ලබන ප්‍රසම්පාදන ක්‍රියාව සඳහා අවශ්‍ය අරමුදල් තිබෙන බවට සහතික වීම;
(ආ) සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත්තුව ලබා දීම සඳහා ප්‍රසම්පාදන කාල සටහන සමාලෝචනය කර ඊට එකඟ වීම;
(ඇ) පළමු රැස්වීමේදී, ප්‍රසම්පාදනය පිළිබඳ ප්‍රචාරක දැන්වීම් පළ කිරීම, ලංසු කැඳවීමේ ලේඛන විකිණීම සහ ලංසු කැඳවීම අවසන් කිරීම සහ විවෘත කිරීම යන කරුණු පිළිබඳව ආකාරය සහ දිනයන් නිර්ණය කිරීම;
(ඈ) ලංසු කැඳවීමේ ලේඛන සහ භාවිත කළ යුතු කොන්ත්‍රාත් ලේඛනවල වර්ගය සහ ස්වභාවය පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව සමඟ එකඟ වීම;
(ඉ) යෝග්‍ය යැයි සළකනු ලබන අවස්ථාවන්හිදී,පැහැදිලි කිරීම් ලබා දීමේදී/ඉල්ලීමේදී තාක්ෂණික ඇගයීම් කමිටුව සමඟ සහභාගී වීම සහ මෙහෙයවීම; හා
(ඊ) ඇගයීම් වාර්තාව සමාලෝචනය කිරීම

# තාක්ෂණික ඇගයීම් කමිටු වර්ග

- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු
- අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු
- ව්‍යාපෘති සහ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු
- ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු සඳහා වන තාක්ෂණික ඇගයීම් කමිටු

ප්‍රසම්පාදන කමිටුවල සාමාජිකයින් සාමූහිකව හා තනි තනිව වගකිව යුතු වන්නේ :

- හැකිතාක් අවම කාල සීමාවක් ඇතුළත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කාල සටහන සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටු වෙත නිර්දේශ කොට එකඟ වීම
- පිරිවිතර ස්වභාවයෙන් උත්පාදනය වන බවටත් සහ තරඟකාරී බව සමාන මට්ටමකින් ප්‍රවර්ධනය කළ හැකි බවටත් සහතික වීම සඳහා පිරිවිතරයන් සමාලෝචනය කර අනුමත කිරීම;
- අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන කමිටු සහ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු විසින් මෙහෙයවනු ලබන ප්‍රසම්පාදන සම්බන්ධයෙන් ලංසු ඉදිරිපත් කිරීමේ අවසන් දිනට දින 10 කට පෙර කිසියම් ලංසුකරුවෙකුගෙන් විරෝධතා ඉදිරිපත් වුවහොත් පිරිවිතරයන් නැවත සළකා බලනු ලබන අතර,ප්‍රසම්පාදන ආයතනය විසින් ලංසු ලේඛන මිලදී ගත් සියලුම ලංසුකරුවන්ට ස්වකීය තීරණය දැනුම් දිය යුතුය.

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

## ඔබට ප්‍රවේශය ලබා ගැනීම අපේක්ෂා කළ හැක්කේ කුමන තොරතුරු සඳහා ද?

පෞද්ගලික අංශයට අයත් නීත්‍යානුකූල වාණිජමය සංවේදී තොරතුරු සඳහා බලපෑමක් නොවන තාක් කල් කොන්ත්‍රාත්තුව සැකසීම, ප්‍රදානය කිරීම සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ තොරතුරු කල් ඇතිව හෙළිදරව් කිරීම සඳහා විවෘත කොන්ත්‍රාත්තු මූලධර්මයන් අවස්ථාව සලසයි. ඒ අනුව, පහත සඳහන් කොන්ත්‍රාත්තු තොරතුරු හෝ අවම වශයෙන් ප්‍රසම්පාදන ආයතනය විසින් නිසි ආකාරයෙන් හෙළිදරව් කළ යුතුය:

- කොන්ත්‍රාත් සැකසුම් සම්බන්ධ තොරතුරු ඇතුළත්ව :
    - අවශ්‍යතා තක්සේරු කිරීම ඇතුළුව ප්‍රසම්පාදන සැලසුම් කිරීමේ ක්‍රියාවලිය
    - ප්‍රසම්පාදන හෝ ප්‍රදානය කිරීමේ ක්‍රමවේදය සහ එහි සාධාරණීකරණයන්;
    - එක් එක් කොන්ත්‍රාත්තුවේ විෂය පථය සහ පිරිවිතර;
    - ඇගයීම සහ තෝරා ගැනීම සඳහා වන නිර්ණායක;
    - එම ක්‍රියාවලියේ ලංසුකරුවන් හෝ සහභාගිවන්නන්, ඔවුන්ගේ වලංගු ලේඛන සහ ඔවුන් නිදහස් කිරීමට සුදුසුකම් ලැබූ ක්‍රියා පටිපාටින්;
    - ළබැඳියාවන් අතර පිළිගැටුම් හෙළිදරව් කිරීම් හෝ නිකුත් කරන ලද තහනම් කිරීම් ;
    - ඇගයීමේ ප්‍රතිඵල, සම්මානය සාධාරණීකරණය කිරීම ඇතුළුව;
    - කොන්ත්‍රාත් ලැබුම්කරුගේ අනන්‍යතාවය සහ වාසිදායක හිමිකාරිත්වය විසින් ලබා දී ඇති යම් ප්‍රකාශයක් ද;

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවතින දූෂණ අවදානම්

- කොන්ත්‍රාත්තුව ලබා දෙන පුද්ගලයින් සහ ලංසුකරුවන් අතර වන ළබැඳියාවන් අතර පිළිගැටුම්
- ටෙන්ඩරය ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කිරීමට අපොහොසත් වීම
- අභ්‍යන්තර වියදම් සැලසුම් පිළිබඳ තොරතුරු පිටතට අනාවරණය වීම
- ඉතා නිශ්චිත හෝ පටු පිරිවිතරයන්
- ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන්ට ඒවා ඉදිරිපත් කිරීමට ඉතා කෙටි කාලයක් ලබා දීම
- ඇගයීම සහ ප්‍රදානය කිරීම පිළිබඳ නිර්ණායක ප්‍රකාශයට පත් නොකිරීම
- ටෙන්ඩර් ප්‍රදානය කිරීමේ ක්‍රියා පටිපාටිය පිළිබඳ වාර්තා සඳහා ප්‍රවේශය නොමැති වීම
- ටෙන්ඩර් ප්‍රදානය කරන ලද්දේ, කාටද යන්න පිළිබඳ තොරතුරු ලබා ගැනීමට නොහැකි වීම
- සාධාරණීකරණයකින් තොරව හදිසි ප්‍රසම්පාදන ක්‍රියාවලිය භාවිතා කිරීම
- ටෙන්ඩර් කැඳවීමට හුදෙක් පෙරාතුව සමාගමක් සංස්ථාගත කිරීම
- එකම කොන්ත්‍රාත්කරු එකම ප්‍රසම්පාදන ආයතනය වෙතින් නැවත නැවතත් කොන්ත්‍රාත්තු ලබා ගැනීම

TRANSPARENCY INTERNATIONAL SRI LANKA
a nation that upholds integrity

# ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවතින දූෂණ අවදානම්

- තරඟකාරී නොවන ක්‍රියා පටිපාටින් අධික ලෙස භාවිතා කිරීම -උදා. - සාධාරණීකරණයකින් තොරව තනි ලංසුකරුවෙකුගේ කොන්ත්‍රාත්තු ලබා ගැනීම
- නැවත සාකච්ඡා කිරීම්හීදි ගිවිසුම් කොන්දේසි ලිහිල් කිරීම
- කොන්ත්‍රාත් කාර්ය සාධනයේ සැලකිය යුතු වෙනස්කම්
- කොන්ත්‍රාත්තුවේ සඳහන් ප්‍රමාණයට වඩා අඩු ගුණාත්මක භාණ්ඩ, සේවා හෝ වැඩ සැපයීම
- කාටල් සහ කුමන්ත්‍රණකාරී ලංසු - ආවරණ මිල ගණන්
- ටෙන්ඩර් දිනා ගැනීම සඳහා තුන්වන පාර්ශවයන් භාවිතා කිරීම - පසුව තරඟ කිරීමට/ජයග්‍රහණය කිරීමට නොහැකි වූ සමාගමකට උප කොන්ත්‍රාත්තුව ලබා දීම
- ප්‍රසම්පාදන ආයතනයෙහි නිලධාරීන්ට තෑගි, අල්ලස්, අනාගත රැකියා ආදිය පිරිනැමීම
- ප්‍රසම්පාදන කමිටුන්හි ළබැඳියාවන් අතර පිළිගැටුම් නියාමනය දුර්වල වීම
- එකම කොන්ත්‍රාත්කරු නැවත නැවතත් කොන්ත්‍රාත් ලබා ගැනීම